# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2446/45 - 2025 ජූලි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2025.07.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DSNI/LAN/10/අත්පත්/51.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2020/CEB/05.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:-*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මත්තක ගමේ අ.ග.පි. 580 දරන පිඹුරේ, කැඩැස්තර සිතියම් අංක 810697 හි කලාප අංක 01 හි පත්‍ර අංක 1 න් දක්වා ඇති පහත විස්තරවන ඉඩම් කැබැල්ල:

1. **කැබලි අංකය : 01**

ඉඩමේ නම: මත්තක වෙල් යාය *හෙවත්* හාතවිල කුඹුර; වර්තමාන ඉඩම් පරිහරණය: රජය; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: මාර්තුපිටිය ඇපාගේ කුලරත්න ඇපා, උඩගෙදරවත්ත, මත්තක සහ තවත් අය; වර්ගඵලය: පර්. 21.7

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2025 සැප්තැම්බර් මස 18 වැනි දින පෙ. ව. 10.00** ට නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා හමු විය යුතුයි.

තව ද, **2025 සැප්තැම්බර් මස 11** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ජී. ජී. ඒ. තිළිණි,**
ප්‍රාදේශීය ලේකම්,
(රාජකාරී ආවරණ),
නියාගම.

2025 ජූලි මස 18 වැනි දින,
නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0297

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : WAN/LND/05/AQUIS/01-L4.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/16/2019/UDA/179.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2429/04 දරන හා 2025.03.24 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ වන්දි පරීක්ෂණ දිනය

2025.05.05 යන්න 2025.10.27 ලෙසත් හිමිකම් ඉදිරිපත් කිරීමට ලබා දී ඇති දිනය 2025.04.28 යන්න 2025.10.17 ලෙසත්, ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම් කැබලිවල විස්තරය කැබලි අංක 1 සහ 4 ද ඇතුළත්ව උපලේඛනය පහත සඳහන් ලෙසත් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි. එමෙන්ම ඇතුළත් නව කැබලි අංක වෙනුවෙන් ද වන්දි පරීක්ෂණ දිනය හා හිමිකම් ඉදිරිපත් කිරීමට ලබා දී ඇති දිනය ඉහත සඳහන් දිනයන්ම වේ.

**උපලේඛනය**

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 635/3 සේරක්කුලිය ග්‍රාම නිලධාරි වසමේ සේරක්කුලිය ගමෙහි පිහිටි, පුත්තලම දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් 2024.12.30 දිනැතිව සකස් කර ඇති අංක ක.සි. 410058 දරන පිඹුරේ කලාප අංක 01 හි පත්‍ර අංක 1 හි පහත මායිම් තුළ පිහිටි ඉඩම් කැබලි,

කැබලි අංකය - 1 (කලපුව සඳහා වෙන් කළ බිම)

| | |
|---|---|
| ප්‍රමාණය | :- හෙක්ටයාර් 1.1329 |
| උතුරට | :- |
| නැගෙනහිරට | :- |
| දකුණට | :- |
| බටහිරට | :- |

කැබලි අංකය - 4 (මාර්ගය)

| | |
|---|---|
| ප්‍රමාණය | :- හෙක්ටයාර් 0.2702 |
| උතුරට | :- කැබලි අංක 3 |
| නැගෙනහිරට | :- කැබලි අංක 3 සහ 6 |
| දකුණට | :- කැබලි අංක 3 |
| බටහිරට | :- කැබලි අංක 3 |

**එස්. එම්. පී. නන්දසේන,**
ප්‍රාදේශීය ලේකම්,
වනාතවිල්ලුව.

2025 ජූලි මස 19 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0298

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.